# දුම්රිය මගින් තොග වශයෙන් භාණ්ඩ ප්‍රවාහනය කරන සැපයුම් කරුවන් ලියාපදිංචි කිරීමේ දැන්වීමයි !

සෞභාගය දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුව තොග වශයෙන් භාණ්ඩ ප්‍රවාහනයේදී ඇතිවන පාරිසරික, සාමාජීය සහ ආර්ථික වාසි සලකා දුම්රිය මගින් තොග වශයෙන් භාණ්ඩ ප්‍රවාහනය ප්‍රවර්ධනය කිරීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක වේ.

මෙම වැඩපිළිවෙල යටතේ තොග වශයෙන් භාණ්ඩ ප්‍රවාහනය කරන ආයතන දුම්රිය දෙපාර්තමේන්තුවෙහි ලියාපදිංචිය කරගැනීමක් සිදුකරන අතර ලියාපදිංචියෙන් පසු සුදුසු ආයතන වෙත තොග වශයෙන් භාණ්ඩ ප්‍රවාහනය කිරීම සඳහා ප්‍රවාහන පහසුකම් ලබා දීම දුම්රිය දෙපාර්තමේන්තුවේ අරමුණ වී තිබේ.

මෙහිදී ප්‍රවාහනය සිදු කරන භාණ්ඩ තොග ගබඩා කිරීම සඳහා දුම්රිය බඩු ගබඩා සහ දුම්රිය ස්ථාන ආශ්‍රිත බිම් ප්‍රදේශ ගාස්තු මත ලබා දීමේ හැකියාවක්ද පවතී.

දුම්රිය දෙපාර්තමේන්තුව හා එක්ව තොග වශයෙන් භාණ්ඩ ප්‍රවාහනයට ඔබ ආයතනය අදහස කරන්නේ නම් දුම්රිය දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය ට (www.railway.gov.lk) පිවිස අයදුම්පත්‍රයක් හා විස්තර මාලාව ලබා ගෙන marketing.slr@hotmail.com යන විද්‍යුත් ලිපිනයට සම්පූර්ණකළ අයදුම්පත්‍රය යොමුකර ලියාපදිංචි වීමට කටයුතු කරන්න. එලෙස සිදු කල නොහැකි ආයතන පහත එක් ක්‍රමයක් මගින් ලිඛිත ඉල්ලීමක් යොමු කර අයදුම්පත්‍රය හා විස්තර මාලාව ලබා ගැනීමට කටයුතු කරන්න.

1. නියෝජ්‍ය අධිකාරී (වෙළඳ හා අලෙවි) , වෙළඳ හා අලෙවි අංශය , දුම්රිය මුලස්ථානය , කොළඹ 10 යන ලිපිනයට ලිඛිත ඉල්ලීමක් කිරීමෙන්
2. එම ඉල්ලීම 0112-431909 අංකයට FAX මගින් යොමු කිරීම
3. marketing.slr@hotmail.com විද්‍යුත් ලිපිනයට ඉල්ලීම යොමු කිරීමෙන්

මුල් ඉල්ලුම් කරුවන් සඳහා ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී(වාණිජ),
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී(වාණිජ) කාර්යාලය,
දුම්රිය මුලස්ථානය,
කොළඹ 10.